ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018/08/03 |

පැමිණිලිකරු : එස්.ඒ.එස්.එම් පියසිරි මයා.
අංක 4/17. නාගස්තැන්න පාර.
මහනුවර.

වගඋත්තරකරුවන් : පො.ප නිශාන්ත හෙට්ටිආරච්චි මයා.
ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
අලවතුගොඩ.

<u>පැමිණිලි අංකය : **HRC/1494/14**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. තමා වෘත්තියෙන් ස්වර්ණාභරණ ව්‍යාපාරිකයෙකු වන බවත්. වෘත්තියේ ස්වභාවය අනුව ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හා බැංකු මඟින් වෙන්දේසියට යොමුකරනු ලබන ප්‍රමිතියෙන් යුක්ත ස්වර්ණාභරණ ලබාගෙන ඒවා වෙළඳ පොලේ මිළ උච්චාවචනය අනුව විකිණීම සිදුකරනු ලබන බවත්. තමා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලියාපදිංචිකරුවෙකු වන බවත්ය.

2011.06.28 වන දින තමා බොයේගම චන්ද්‍රසේන සුරේන් පෙරේරා හා තංගරාජ් කමලරාජ් සමඟ පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා අලවතුගොඩ නගරයේ ගමන් කරමින් සිටියදී අලවතුගොඩ බැංකුව ඉදිරිපිට සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයින් පස් දෙනෙක් පමණ තමන් ගමන් ගත් ත්‍රීරෝද රථය ලඟට පැමිණ සුරේන් පෙරේරා යන අයගේ මුදල් පසුම්බිය ඉල්ලා සිටි අවස්ථාවේ ඔවුන් කවුරුන්ද කියා ප්‍රශ්න කළ බවත් එහිදී ඔවුන් රහස් පොලීසියේ නිලධාරීන් බව පැවසූ බවත් පසුව තංගරාජ් කමලරාජ් යන අයගේද හැඳ සිටි ඇඳුම් පරීක්ෂා කොට කිසිදු හේතුවක් නොදන්වා අලවතුගොඩ පොලීසියට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත.



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541/74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580/81/82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2505575 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

අලවතුගොඩ පොලීසියට රැගෙන ගොස් වෙන් වෙන්ව තමන් ඇතුළු පිරිසගෙන් ප්‍රශ්න කළ අතර එම අවස්ථාවේදී තමා බලපත්‍ර සහිතව රන් භාණ්ඩ නිෂ්පාදනය කරන අයෙක් බවත්. බැංකු මඟින් වෙන්දේසියට යොමුකරන භාණ්ඩ නැවත බැංකුවට උකස් කර මුදල් ලබාගැනීමේ ව්‍යාපාරයක් කරන බව තමා පැවසූ බවත් බැංකුවට රන් බඩු උකස් කලේදැයි අසා තමාට ඉතා අමානුෂික ලෙස කතාකර පොලිස් ස්ථානාධිපතිවරයාට ඉදිරිපත් කර ඔවුන් නිදන කාමරයක් තුළට තමාව ගෙන ගොස් පහරදී සියළු ඇඳුම් ගලවා තමාට පහරදුන් බවත් එම අවස්ථාවේදී තමා සතුව තිබූ රන් වළලු 02 සහ මුදු 3 පෙන්ඩන් 2 ක් හා රුපියල් තිස්දහසක මුදල එතැන සිටි අයෙක් විසින් රැගෙන සාක්කුවට දමාගත් බවත් එම අවස්ථාවේ සියළු නිලධාරීන් සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත් පසුව ඔවුන් තමාව නියෝජ්‍ය ස්ථානාධිපතිට භාරදෙන අවස්ථාවේදීත් පහරදී අත් පිටුපසට කර මාංචු දමා දණගස්සවා ප්‍රකාශ සටහන් කරගත් බවත් දක්වා ඇත.

ඒ අවස්ථාවේදී තමා පොලිස් අත්අඩංගුවේ සිටින බව තමාගේ බිරිඳ හෝ පවුලේ කිසිවෙකුත් නොදැන සිටි බවත්. තමාව මරණ බවට හා ඇප ලබාගත නොහැකි වන සේ චෝදනා එල්ල කරන බවට තර්ජනය කළ බවත්. පසුව අලවතුගොඩ ස්ථාධිපතිවරයා සහ නියෝජ්‍ය ස්ථානාධිපතිවරයා ඇතුළු පුද්ගලයින් දෙදෙනකු වෑන් රථයක් ගෙන තමා හා සුරේන් පෙරේරා වෑන් රථයට ඇඳ දමා තමා පදිංචි මහනුවර දෙයින්නේවෙල නිවසට පැමිණ තමා විසින් බැංකුවට උකස් කර තිබූ බැංකු රිසිට්පත් සියල්ලමද අල්මාරිය ඇර බැංකු ගිණුම්පොත් ආදී සියළු දේ පොලිස් නිලධාරීන් භාරයට ගත් අතර රණ් භාණ්ඩ නිපදවන රන් කැබලි ග්‍රෑම් 40 ක්ද තඹ රිදී ලෝහ කොටස්ද ලබාගත් බවත්. පසුව සුරේන් පෙරේරාගේ නිවසටද ගොස් පරික්ෂා කර නැවත පොලීසියට රැගෙන විත් පසුපසට කර මාංචු දමා පසුදා එළිවන තුරුම ලබාගත් බවත් සඳහන් කර ඇත.

2011.06.29 වන දින අලවතුගොඩ පොලීසිය නැවත තමාගේ ගෙදරට ගොස් නිවසේ සියළු අභ්‍යන්තරය වීඩියෝ ගතකරගෙන පැමිණි බවත්. ඡායාරූප ශිල්පියෙකු පොලීසියට ගෙන්වා විවිධ ඉරියව් වලින් තමාව සිටුවා තමාගේ විරුද්ධතාවය මත ඡායාරූප හා ඇඟිලි සටහන් ලබාගත් බවත්. එදින තමා ඇතුළු දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කළ මුත් ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කර බන්ධනාගාරගත කර මාස 8 කට ආසන්න කාලයක් පරික්ෂණ කටයුතු තිබේයැයි පවසා රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්. ඉන්පසු ඇප ලබාගෙන නිවසට පැමිණ නැවත ව්‍යාපාර කටයුතු සඳහා තමාගේ ජාතික හැඳුනුම්පත්. ව්‍යාපාරයට අදාළ සහතික නොමැති වීමෙන් මෙතෙක් කිසිදු ව්‍යාපාරයක් කරගැනීමට නොහැකි තත්වයකට පත්වී ඇති බවත්. නඩු වාර කිහිපයකදීම හැඳුනුම්පත් හා බලපත්‍ර ඉල්ලා සිටියත් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට යවා ඇති බව පවසා සිටි බවත් සඳහන් කර ඇත.

මේ හේතුවෙන් තමාට රැකියාවක් කිරීමටද නොහැකිව දැඩි ආර්ථික හා මානසික පසුබෑමක් උදා වී ඇති බවත් අංක 16775 දරණ නඩුවට පෙනී සිටි අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් මෙම නඩුව පවත්වාගෙන යාමට සාධක නොමැති බවත් එම නඩුව පැවරූ ස්ථානාධිපති ඒ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරන ලෙසට පොලීසිය වෙත දන්වා සිටි බවත් ඇප කොන්දේසි අනුව පොලිස් ස්ථානයට අත්සන් කිරීමට ගිය අවස්ථාවේ ස්ථානාධිපතිවරයා තමාට වරද පළිගන්නා ලෙසත්. එසේ

වුවහොත් සුළු දඩයකින් නිදහස් විය හැකි බවත් එසේ නොමැති නම් ඇප ලබා ගැනීමට නොහැකි වන සේ චෝදනා කර නඩුවක් පවරා සදාකාලිකවම හිරේ යවන බවට තර්ජණය කළ බවත්. සඳහන් කර ඇත.

මේ හේතුවෙන් තමා දැඩි බියකින් පසුවන බවත් තමා සතු සියළු ලියකියවිලි පොලීසිය සතුව ඇති බැවින් එය තමන්ට හා තමන්ගේ පවුලේ අයගේ ආරක්ෂාවට තර්ජණයක් වන බැවින්ද මේ සඳහා පරීක්ෂණයක් කර සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවීය කරුණු දැක්වීම :-

උක්ත පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය අලවතුගොඩ පොලිස් ස්ථානාධිපති විසින් වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. පැමිණිලිකාර සුදන්ත මහින්ද පියසිරි යන අය හා තවත් සැකකරුවන් දෙදෙනකු සමඟ 2011.06.30 වන දින පැය 16.30 ට අලවතුගොඩ නගරයේදී වෙනත් තැනැත්තන් දෙදෙනකුගේ හැඳුනුම්පත් දෙකක්. රන් පැහැති ඇතුළත රිදී පැහැදි වළල්ලක්. රන් පැහැති මුදු දෙකක්. හා රන් පැහැති පෙන්ඩනයක් ලඟ තබාගන සිටියදී ඔවුන් කෙරෙහි ඇති වූ සැකයක් මත ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත.

ඔවුන්ගේ ප්‍රශ්න කිරීමේදී ඉහත සැකකරුගේ නිවසේ ව්‍යාජ ලෙස රන් ආභරණ සකසා කූඨ ලෙස සකස් කරන ලද ඔවුන් භාරයේ තිබූ ජාතික හැඳුනුම්පත් දෙක හා ඔහු සමඟ අත්අඩංගුවට ගත් අනෙක් සැකකරුවන් දෙදෙනාගේ හැඳුනුම්පත් උපයෝගී කරගනිමින් ව්‍යාජ ලිපින ඉදිරිපත් කර මහනුවර. මාතලේ. කෑගල්ල යන දිස්ත්‍රික්ක වල රාජ්‍ය හා පුද්ගලික බැංකුවලට උකස් කර මුදල් උපයාගන්නා බව හෙළිවූ බවද සඳහන් කර ඇත.

ඒ අනුව 2011.06.30 දිනම එම ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් යොදවා ඉහත සැකකරුගේ නිවස පරීක්ෂාවට ලක්කර පොලිස් ඡායාරූප ශිල්පීන් ලවා වීඩියෝ හා ඡායාරූප ගතකර සැකකරුගේ රණ් ආභරණ නිෂ්පාදනාගාරයේ තිබී විවිධ බැංකුවලට උකස් කරන ලද උකස් පත්‍රිකා 314 ක් පමණ භාරයට ගත් බවත් තවද රිදී ග්‍රෑම් 11. රන් කැබලි. තඹ කැබලි. වෙනත් පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් 06ක්ද නඩු භාණ්ඩ ලෙස තම භාරයට ගත් බවද සඳහන් කර ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ අදාළ සැකකරු ලඟ තිබූ ජාතික හැඳුනුම්පත් දෙක වෙනත් තැනැත්තන් දෙදෙනකුට අයත් ඒවා බවත් ඒවා හැඳුනුම්පත්වල ඡායාරූප බවත් ඒවා වෙනත් ඡායාරූප සම්බන්ධ කර කූඨ ලෙස සකස් කරන ලද ඒවා බවත් අනෙක් හැඳුනුම්පත් වෙනත් පුද්ගලයන්ගේ අස්ථානගත වූ ඒවා බවත් සඳහන් කර ඇත.

සැකකරුවන් තිදෙනාම 2011.07.01 දින ගරු මහේස්ත්‍රාත්තුමිය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු. 10.723.181.80/- ක් වංචා කර තිබූ නිසා රක්ෂිත බන්ධනාගාරගත කර විමර්ශන සඳහා කල් ලබාදුන් බවත් අදාළ සැකකරු අලවතුගොඩ ලංකා බැංකුවට හා මහජන බැංකුවට මෙලෙස ව්‍යාජ ලෙස

ලේඛන සකස් කර උකස් කර තිබූ භාණ්ඩ හා ඒවා සම්බන්ධ බී 17014/11. බී 17015/11 යටතේ කරුණු වාර්තා කර ඒ අනුව 59384. 593හි 59387 යටතේ නඩු පවරන ලද බවත් දක්වා ඇත.

අදාළ සැකකරුවන් විවිධ දිස්ත්‍රික්කවල බැංකුවලට උකස් කර තිබූ භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ බැංකු දැනුවත් කරමින් විමර්ශන සිදුකළ බවත් ඒ ඒ ස්ථානවලින් සැකකරුවන්ට එරෙහිව නඩු පවරා තිබූ බැවින් සැකකරුවන්ට ඇප ලබාගැනීමට දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතකර තිබීමට සිදුවූ බවත් සඳහන් කර ඇත.

තවද පැමිණිලිකාර පියසිරි යනඅය පවසා ඇති ආකාරයට 2011.06.28 දින අත්අඩංගුවට නොගත් බවත්. ඔවුන් අත්අඩංගුවට ගනු ලැබුයේ 2011.06.30 දින බවත්. අත්අඩංගුවට ගනු ලැබූ සියළු භාණ්ඩ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් ඔහුගේ පැමිණිල්ලේ සඳහන් පරිදි රත්‍රං ග්‍රෑම් 40 ක් අත්අඩංගුවට නොගත් බවත්. රත්‍රං ග්‍රෑම් 6.500 ක් පමණක් අත්අඩංගුවට ගත් බවත්. මෙම සැකකරුට කිසිදු වධහිංසාවක් තමා හෝ තමාගේ නිලධාරීන් විසින් නොකළ බවත්. කිසිදු තර්ජණය කිරීමක් හෝ ඔහු පවසන ආකාරයට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තු බලපත්‍ර තිබුනද ඒවා 2006 වසරෙන් පසු අලුත් කර නොමැති බවත් 2011 දී ඔහුට අදාළ දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් නොමැති බවත් දක්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු වෘත්තියෙන් ස්වර්ණාභරණ ව්‍යාපාරිකයෙකු වන අතර වෘත්තියේ ස්වභාවය අනුව ස්වර්ණාභරණ නිෂ්පාදනය හා බැංකු මගින් වෙන්දේසියට යොමු කරනු ලබන ප්‍රමිතියෙන් යුක්ත ස්වර්ණාභරණ ලබාගැනීම හා ඒවා වෙළඳ පොලේ මිළ උච්චාවචනය අනුව විකිණීම සිදුකර ඇත.

2011.06.28 දින පැමිණිලිකරු බී.යී සුරේන් පෙරේරා හා තංගරාජ් කමලරාජ් යන අය සමඟ තීරෝද රථයකින් අලවතුගොඩ නගරයේ ගමන් කරමින් සිටියදී වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරු ඇතුළු පිරිස අත්අඩංගුවට ගෙන අලවතුගොඩ පොලීසියට රැගෙන විත් ඇත.

අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමෙන් පසු පැමිණිලිකරුගේ නිවසේ තවත් ව්‍යාජ රන් භාණ්ඩ ඇති බව පරීක්ෂා කිරීම සඳහා පැමිණිලිකරු හා බී.යී සුරේන් පෙරේරා සමග පැමිණිලිකරුගේ නිවසට ගොස් නිවස පරීක්ෂා කර නිවසේ අල්මාරියේ තිබී ඇති බැංකු රිසිට්පත් බැංකු ගිණුම් පොත් රන් කැබලි හා රන් ආකෘති සැදීමට උපයෝගී කර ගන්නා තඹ හා රිදී ලෝහ කොටස් අත්අඩංගුවට ගෙන ඇත.

වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2014.05.13 දිනැති වාර්තාවෙහි පැමිණිලිකරු ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්නා ලද්දේ 2011.06.30 වන දින 16.30ට බව සඳහන් වුවද පැමිණිලිකරු ඇතුළු පිරිස 2011.06.28 දින අලවතුගොඩ නගරයේදී අත්අඩංගුවට ගෙන ඇති බව පැමිණිලිකරුගේ බිරිඳ වන බෙරයගොඩගේ පූර්ණිමා යන අය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයෙන්ද. පැමිණිලිකරුගේ නැන්දම්මා වන ලංකාහළුගේ රූපවතී යනඅය විසින් ඉදිරිපත් කර

ඇති දිවුරුම් ප්‍රකාශය මඟින්ද, අත්අඩංගුවට ගත් තංගරාජ් කමලරාජ් යන අයගේ බිරිඳ වන මුත්තයියා යෝගේෂ්වරි යන අය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මඟින්ද තහවුරු වේ. ඒ අනුව පැමිණිලිකරු ඇතුළු පිරිස දින 03 ක කාලයක් නීති විරෝධී ලෙස රඳවාගෙන ඇති බව තහවුරු වේ.

පැමිණිලිකරු ඇතුළු පිරිස අත්අඩංගුවට ගැනීමෙන් පසු තොරතුරු ලබා ගැනීම සඳහා අමානුෂික ලෙස පහරදුන් බව පැමිණිල්ලේ සඳහන් වුවද ඔවුන් වධහිංසාවට ලක් වූ බව තහවුරු කළ හැකි වෛද්‍ය වාර්තාවක් හෝ ඇසින් දුටු කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බැවින් වධහිංසාවට ලක්වූ බවට තහවුරු කිරීමේ හැකියාවක් නොමැත.

පැමිණිලිකරු විසින් ව්‍යාජ රන් භාණ්ඩ සකසා රාජ්‍ය හා පෞද්ගලික බැංකුවලට උකස් තබා මුදල් වංචා කර ඇති බවට චෝදනා කරමින් විශාල නඩු සංඛ්‍යාවක් පවරා ඇති අතර ඉන් බොහෝ නඩුවලින් පැමිණිලිකරුව නිදොස් කොට තිබීමෙන් පෙනී යන්නේ වගඋත්තර පාර්ශවය අසත්‍ය චෝදනා එල්ල කරමින් පැමිණිලිකරුට නඩු පවරා ඇති බවයි.

පැමිණිලිකරුගේ නිවසේ තිබූ භාණ්ඩ අත්අඩංගුවට ගැනීමට සෝදිසි වරෙන්තුවක් ලබාගැනීමට වගඋත්තර පාර්ශවයට හැකියාවක් තිබියදී කිසිදු සෝදිසි වරෙන්තුවක් නොමැතිව මෙම නිවස පරීක්ෂා කිරීම මඟින් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ වගන්ති වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවද තහවුරු වේ.

වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කරන ආකාරයට 2011.06.30 වන දින පැමිණිලිකරු ඇතුළු පිරිස් අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ ඔවුන් සන්තකයේ තිබී සොයාගන්නා ලද ව්‍යාජ ලෙස සැකසූ හැඳුනුම්පත් සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය කිසිදු විමර්ශනයක් සිදුකර ඇති බව නොපෙනෙන අතර අංක 853034746 වී දරණ ජාතික හැඳුනුම්පත හිමි චමින් පුෂ්පකුමාර යන අයගෙන් ප්‍රකාශයක් පමණක් සටහන් කරගෙන ඇත්තේ 2014.05.05 දින වේ. එහෙත් 2011.06.30 වන දින සිරභාරයට ගෙන ඇති අංක 891140145 වී දරණ ජාතික හැඳුනුම්පත හිමි රොෂාන් කීර්ති බංඩාර රත්නායක යන අයගෙන් ප්‍රකාශයක් 2011.07.07 දින සටහන් කරගෙන ඇති බව පෙනී යයි. පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසු වගඋත්තර පාර්ශවය වෙත කොමිෂන් සභාව මඟින් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2014.05.08 දිනැති දැනුම් දීමෙන් පසු වසර 3 කට පෙර අත්අඩගුංවට ගත් හැඳුනුම්පත් 2 ක් සඳහා කූඨ ලේඛන සකස් කිරීම යටතේ පැමිණිලිකරු ඇතුළු තිදෙනාට එරෙහිව 2014.05.14 දිනැතිව නඩුවක් ගොනු කර ඇති බව අවධානයට ලක්වේ.

2011.06.28 වන දින පැමිණිලිකරු ඇතුළු තිදෙනා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අත්අඩංගුවට ගනු ලබන වරද කියා නොදුන් බව ප්‍රකාශ කර ඇති අතර. අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා විසින් තබා ඇති සටහනෙහිද පැමිණිලිකරුවන් අත්ඩංගුවට ගත් බව සටහන් වී ඇති නමුත් වරද කියා දී අත්අඩංගුවට ගත් බවට සටහන් කර නොමැත. ඒ අනුව පැමිණිලිකරු ඇතුළු තිදෙනා අත්අඩංගුවට ගැනීමේදී වරද කියා දී ඇති බව තහවුරු නොවේ.

නිගමනය :-

පැමිණිල්ලට අදාළව ඉදිරිපත් වී ඇති ලේඛන හා විමර්ශනය අනුව පැමිණිලිකරු ඇතුළු තිදෙනා 2011.06.28 වන දින අත්අඩංගුවට පත්වී ඇති බවත්, අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ අත්අඩංගුවට ගැනීමේ වරද කියා දී නොමැති බවත් අත්අඩංගුවට ගැනීමෙන් පසු දින 03 ක් නීති විරෝධී ලෙස රඳවාගෙන ඇති බවත්, නිගමනය කරන අතර එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1). හා 13(2) යන ව්‍යවස්ථාවන් මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 25,000/- ක වන්දි මුදලක් හා ගාස්තු වශයෙන් රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2018.09.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

සැ.යු :- අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතු බවට වගඋත්තරකරුවන් වෙත දන්වමි.

B/